සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10 ශ්‍රේණිය	චිත්‍ර කලාව I	කාලය நேரம் Time	පැය 01 යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- සියළුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න



1. ඉහත දැක්වෙන ගෘහ නිර්මාණ අංගය .....විහාර භූමිය තුළ දක්නට ලැබේ.
2. මෙය .....නමින් හඳුන්වයි.
3. මෙම නිර්මාණය .....යුගයේ ඉදිවූ බව සඳහන් වේ.
4. මෙහි මධ්‍යයේ ඇති ස්තූපය වටා පරිවාර ..... සතරක් දක්නට ලැබේ.
5. මෙම ගෘහ නිර්මාණ අංගයේ දිශා අටට මුහුණලා ..... රූප අටක් කැටයම් කර ඇත.

Past Papers Wiki

- **අංක 6 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

6. **කඩදාසි අතින් ඉරා අලවා** සිදු කරන නිර්මාණ හඳුන්වන නම කුමක්ද?

.....

7. **තලන වැඩ සහ වාත්තු** වැඩ සිදු කරනු ලබන්නේ කුමන කර්මාන්තයේද?

.....

8. නව කැළණි විහාරයේ **හේමමාලා හා දන්ත කුමරු** සිතුවම ඇඳි ශිල්පියා කවිද?

.....

9. මහනුවර යුගයේ ශෛලියෙන් නිම වූ **අනෝතප්ප විල සිතුවම** දැක ගත හැකි ප්‍රසිද්ධ ලෙන් විහාරය කුමක්ද?

.....

10. **කාන්තා රූප හතකින්** නිර්මාණය වූ සාම්ප්‍රදායික සැරසිල්ල කුමක්ද?

.....

- **11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න**

11. **එම්.සාර්ලිස් ශිල්පියා** විසින් සිතුවම් ඇඳි විහාරය වන්නේ මින් කුමක්ද?
1.) කොළඹ මාළිගාකන්ද විහාරය ය. 2.) නව කැළණි විහාරයේ ය.
3.) ගෝතමී විහාරය ය. 4.) කතළුව පූර්වාරමය ය.

12. **ලංකාතිලක** විහාරයේ නිර්මාණ ශිල්පියා වනුයේ,
1.) ගනේෂ්වරාචාර්ය ය. 2.) දෙල්මඩ මූලාචාර්ය ය. 3.) ස්ථපතිරායර් ය. 4.) දේවේන්ද්‍ර මූලාචාර් ය.

13.**තුවක්කු අතින් ගත් මාරයන්** සහිත මාර පරාජය සිතුවම දක්නට ලැබෙන්නේ,
1.) මැදවල විහාරයේ ය. 2.) දඹුළු විහාරයේ ය.
3.) ලංකාතිලක විහාරයේ ය. 4.) දෙගල්දොරුව විහාරයේ ය.

14.දේශීය **රූකඩ** කලාවට ප්‍රසිද්ධ ප්‍රදේශය වන්නේ,
1.) අම්බලන්ගොඩ ය. 2.) අහුල්මඩුව ය. 3.) කිරිවවුල ය. 4.) හංදෙස්ස ය.

15.ශ්‍රී ලංකාවේ **ප්‍රථමයෙන්** ඉදිවූ බවට පුරා විද්‍යාත්මක පිළිගැනෙන ස්ථූපය වන්නේ,
1.) ජේතවනාරාමය 2.) අභයගිරිය 3.) ථූපාරාමය 4.) ලංකාරාමය

- **අංක 16 සිට 20 තෙක් දී ඇති වචන වල අර්ථය පැහැදිළි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

16.**දේවතා කොටුව** :.....

.....

17.**සන්නිදර්ශන**;-.....

.....

18. රත්වත්තේ අලංකාරය ; .....

.....

19.පර්යාවලෝකනය ; -.....


.....

20.වෘෂභ කුඤ්ජරය:- .....


.....

- **අංක 21 සිට 25 තෙක් දී ඇති රූප සටහන් වලට කිසියම් සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියෙන් ඇති A,B,C,D,E යන ඒවා අතුරෙන් තෝරා, එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

21.  [.....]

 **A**

22.  [.....]


 **B**

23.  [.....]

 **C**

24.  [.....]

 **D**

25.  [.....]

 **E**

- **අංක 26 සිට 30 තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

26.මහනුවර දළදා මාළිගයේ පත්තිරිප්පුව නිර්මාණය කළ ශිල්පියා වන්නේ .....
..... ය.

27.මැදවල ටැම්පිට විහාරයේ සිතුවම් කර ඇති ජාතක කතා අතර වෙස්සන්තර ජාතකය හා .....ජාතකය ප්‍රධාන වේ.


28.මිසර යුගයට අයත් තීරුවක් තුළ සංරචනය කර ඇති .....
සිතුවම මඟින් පක්ෂීණ්ගේ ජංගම ස්වභාවය පෙන්නුම් කරයි.

29.දඹුළු විහාරයේ සිත්තම් නිර්මාණය කිරීමේ ගෞරවය හිමි වන්නේ .....
පරම්පරාවටය.

30.පැරණි ග්‍රීක දාර්ශනිකයින් නිරූපණය කරන ..... සිතුවම රෆායෙල් විසින් අඳින ලද්දකි.

- **අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්න වලට F,G,H,I,J යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**


F


G


H


I


J

31. **F** අක්ෂරයෙන් දැක්වෙන **මූර්තිය** කුමන ශිෂ්ටාචාරයකට අයත් ද ?

.....

32. **G** අක්ෂරයෙන් දැක්වෙන **ස්ක්‍රයිබ්** නැමැති මූර්තිය නිර්මාණය කර ඇති මාධ්‍ය හඳුන්වන්න.

.....

33. **H** අක්ෂරයෙන් දැක්වෙන **පියෙටා** නම් මූර්තියේ නිර්මාණ ශිල්පියා කවුරුන්ද?

.....

34. **I** අක්ෂරයෙන් දැක්වෙන **සුදු කුකුළා** නැමැති සිතුවම ඇඳි ශිල්පියා කවුරුන්ද?

.....

35. **J** අක්ෂරයෙන් දැක්වෙන **ඇම්බැක්කේ** දේවාලයේ දැකිය හැකි ඉහත කැටයම කුමන නමකින් හඳුන්වයිද?

.....

Past Papers Wiki

- පහත දැක්වෙන චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි **අංක 36 සිට 40** තෙක් දී ඇති උප මාතෘකා වලට අදාළව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.(තනි වචනයෙන් පිළිතුරු සැපයීම ලකුණු නොලැබීමට හේතුවක් වනු ඇත.)



36. හඳුනාගත්බව : .....

.....

37. යුගය : .....

.....

38. මාධ්‍ය : .....

.....

39. ශිල්පියා: .....

.....

40. කලා ලක්ෂණ : .....

.....

PAST PAPERS WIKI

Past Papers Wiki



WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம் தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province Department of Education, Southern Province

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	චිත්‍ර කලාව II (බලා ඇඳීම)	කාලය / நேரம் / Time

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු (30) ක් හිමිවේ. අවශ්‍ය ද්‍රව්‍ය පහත පරිදි සපයා ගන්න

- සණකාහයක හැඩය ගත් පෙට්ටියක්
- රතු , කහ මිශ්‍ර මල් වලින් යුක්ත වර්ණවත් රෙදි කැබැල්ලක්
- පැපොල් ගෙඩියක්
- පළල් කොළ සහිත ක්‍රෝටන් අත්තක් (කොළ පහක් පමණ)
- නිල් පැහැති ප්ලාස්ටික් ජෝගුවක්.
- ආධාරකයක්

- රූපයේ පෙන්වා ඇති පරිදි ද්‍රව්‍ය කට්ටලය 73 cm පමණ උස ලැලි ඩෙස් එකක් භාවිතා කර සකසා ගන්න. ඩ්‍රෝවින් ලැල්ල ඇස් මට්ටමින් පහතට වන්නට සකස් කරන්න. මෙහි දී කොළ අත්ත ඇස් මට්ටමට සම විය හැකිය.



PAST PAPERS WIKI

Past Papers Wiki



WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය	චිත්‍ර කලාව III	කාලය / நேரம் / Time: පැය 02 යි

නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. : .....

දිය සායම්, පෝස්ටර් සායම්,පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකිය.

“අ”කොටසින් හෝ “ආ” කොටසින් හෝ “ඉ”කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන එක් චිත්‍රයක් පමණක් ඇඳ වර්ණ කරන්න.

“අ කොටස” - චිත්‍ර සංරචනය

01.බක්මහ උලෙළේ සිත්ගත් ජන ක්‍රීඩාවක අවස්ථාවක්
02.ගමේ දොල පහරක දිය කෙලිමින් සිටින ළමයින් පිරිසක්
03.වැව් ඉස්මත්තේ දිය සොයමින් යන මුව රංචුවක්

“ආ” කොටස - මෝස්තර නිර්මාණය

04.ඕවලාකාර හැඩයෙන් යුත් පිත්තල බන්දේසියක් සාම්ප්‍රදායික සැරසිලි ඇසුරින් අඳින්න.
05.චිත්ත රෙද්දක් සඳහා වදමල් සහිත ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
06.ජ්‍යාමිතික හැඩතල ඇසුරින් කුෂන් කවරයක් නිර්මාණය කරන්න.

“ඉ “- කොටස -ග්‍රැෆික් චිත්‍ර

07.ජංගම දුරකථනයකට සුදුසු ඇසුරුමක් වෙළඳ නාමයක් සහිතව නිර්මාණය කරන්න.
08.ක්‍රීඩා උත්සවයට සුදුසු ආරාධනා පත්‍රයක් අඳින්න.
09.දහම් පාසල සඳහා සුදුසු නිළ ලාංඡනයක් අඳින්න.
10.’’ගංවතුර වළකමු” තේමාවට උචිත පෝස්ටරයක් නිර්මාණය කරන්න.

PAST PAPERS WIKI

Past Papers Wiki



WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library